# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2475/33 - 2026 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2026.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 4-3/13/2020/PC/293.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

උතුර පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් බටහිර, සංකානෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අරාලි මධ්‍යම ජේ/161 ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 910182 හි කලාප අංක 05, පත්‍ර අංක 2 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4085 ක් වූ පහත සඳහන් කැබලි අංක 1 දරන බිම් කැබැල්ල :-

**01. කැබලි අංකය 1**

ඉඩමේ නම: තුම්පලෛ; විස්තරය: ස්ථිර ගොඩනැගිලි 02 සිමෙන්තියෙන් තැනූ ලිං 02 උඩින් වතුර ටැංකියක්; හිමිකරුගේ නම: පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව උතුරු පළාත; ප්‍රමාණය: හෙක්. 0.4085.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනා ම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 මාර්තු මස 25 වැනි දින පෙ. ව. 10.00** ට වලිකාමම් බටහිර සංකානෙ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2026** මාර්තු මස **11** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කවිතා උදයකුමාර්,**
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් බටහිර, සංකානෙ.

2026 පෙබරවාරි මස 11 වැනි දින,
වලිකාමම් බටහිර, සංකානෙ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0106

G 046287 - 23 (2026/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම
(නිවැරදි කිරීම)

*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අංකය* : 03J/84/LG/28.
*මගේ අංකය* : LA/1774.

අංක 2470/55 හා 2026.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවෙහි සිංහල භාෂාවෙන් පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ ඉඩමේ විස්තරයෙහි ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1.054 යන්න වෙනුවට හෙක්ටයාර් 1.0746 ලෙස සඳහන් වී ඇත. ඒ බැවින් “හෙක්ටයාර් 1.0746 යන්න හෙක්ටයාර් 1.054 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කු. පිරබාකරමූර්ති මහතා,**
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් නිරිත,
සන්ඩිලිපාය්.

2026 ජනවාරි මස 28 වැනි දින,
සන්ඩිලිපාය් වලිකාමම් නිරිත,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.